# ශ්‍රී ලංකාවේ රූපවාහිනී මාධ්‍යයේ ඉතිහාසය
# (පූර්ව - රූපවාහිනී යුගය පිළිබඳ අධ්‍යයනයක්)

විජයානන්ද රූපසිංහ

**සාරාංශය**

ශ්‍රී ලංකාවේ නිල රූපවාහිනී ඉතිහාසය ආරම්භ වූයේ 70 දශකයේ අගභාගයේ දී ය. ඒ ස්වාධීන රූපවාහිනියේ ආරම්භයත් සමඟිනි. රූපවාහිනී මාධ්‍ය මෙරට වඩාත් හොඳින් තහවුරු වූයේ 80 දශකය මුලභාගයේ දී ජාතික රූපවාහිනියේ ආරම්භය සමගිනි.

කිසියම් රටකට නව මාධ්‍යයක් හඳුන්වාදීම පිටුපස පවතිනුයේ විවිධ සමාජ, ආර්ථික, දේශපාලන හේතු සමූහයකි. ලෝකයේ ඕනෑම රටක රූපවාහිනී මාධ්‍යයේ හඳුන්වාදීම් ඇසුරින් මේ තත්ත්වය වඩාත් හොඳින් දැකගත හැකිවේ.

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ මෙරටට රූපවාහිනිය හඳුන්වාදීම පසුපස පැවති සමාජ ආර්ථික හා දේශපාලන තත්ත්වයන් පිළිබඳ විමසීමක් කිරීමත්, රූපවාහිනියට පූර්ව යුගයේ ඒ පිළිබඳ ව පැවති ප්‍රතිපත්තිමය තත්ත්වයන් හා සංවාදයන් පිළිබඳ නිරීක්ෂණය කිරීමත් ය.

ඒ සඳහා ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යයනයන්, පාර්ලිමේන්තු වාදවිවාද, කොමිෂන් සභා වාර්තා හා පුද්ගල අත්දැකීම් පාදක කරගනු ලැබිණි. නව මාධ්‍යයන් හඳුන්වාදීමේ දී ඕන ම සමාජයක පවත්නා ආගන්තුකයා කෙරෙහි ඇති බිය (නවීකරණ ක්‍රියාවලිය පිළිබඳ ව පවත්නා ආකල්ප) ලාංකීය සමාජය තුළත් හඳුනාගත හැකි ය.

"රූපවාහිනී නොලත් ශ්‍රී ලාංකිකයෝ කතා කරමින් කියවමින් හා උත්සවයක දී පොල්ගෙඩියක් ගැසීමෙන් ජීවත්වෙති."

"අධික සාක්ෂරතාව හා නිදහස් අධ්‍යාපනය ගැන ශ්‍රී ලාංකිකයෝ සාඩම්බරවෙති. ගැටවරයෝ පොල්ගස්වලට හාන්සි වී පුවත්පත් දෙස බලාසිටින ආකාරය ඉතා දිළිඳු ගම්බද ප්‍රදේශවල පවා දකගත හැකියි."

Jay Mathews- **Land without Television**

Washington Post, 1976 Auguest 20

## හැඳින්වීම :-

ජනමාධ්‍යය අතරින් ශ්‍රී ලංකාවට පුවත්පත හා ගුවන්විදුලිය හඳුන්වා දෙනු ලබන්නේ යටත් විජිත පාලකයින් විසින් ඒ 19 හා 20 සියවස් මුල් භාගයේ දී ය. පුවත්පත් මුද්‍රණයට අවශ්‍ය තාක්ෂණික දැනුම ලැබුණේ ද යටත් විජිත පාලකයින්ගෙනි. කාලරාමුව පිළිබඳ සලකා බැලීමේ දී යුරෝපයේ සිට මුද්‍රණ තාක්ෂණය මෙරටට ළඟාවීමට සියවස් දෙකක් පමණ ගතවුණි. ඉන්දියාවේ පුවත්පත් ආරම්භ වූයේ 1780 දී ය. භූගෝලීය වශයෙන් එක් ඒකකයක් තුළ පැවතිය ද මෙරට පුවත්පතක් ආරම්භ වීමට තවත් දශක ගණනාවක් ගතවිය.

ගුවන්විදුලි මාධ්‍යන්ගේ පැමිණීම පුවත්පත හා සැසඳීමේ දී ඉතා වේගවත් විය. බ්‍රිතාන්‍ය යටත් විජිත වීම හා පළමු ලෝක යුද්ධය ඊට බලපෑ සාධක අතර විය.

එහෙත් රූපවාහිනියේ ආරම්භය සිදුවනුයේ තරමක් වෙනස් මුහුණුවරකිනි. 1930 දශකයේ දී තාක්ෂණික වශයෙන් වර්ධනය වූ අතර 1959 වනවිට ඉන්දියාව එය අත්හදා බලනු ලැබිණි. ශ්‍රී ලංකාවට රූපවාහිනිය ලැබනුයේ අන් කවර මාධ්‍යයකටත් වඩා පුළුල් වූ සංවාදයන්ට පසුව ය.

මෙම ලිපියේ දී උත්සහ කරනු ලබන්නේ එම කාලපරිච්ඡේදය පිළිබඳ මූලික අධ්‍යයනයක නිරත වීම යි.

ශ්‍රී ලංකාවේ පූර්ව රූපවාහිනී ඉතිහාසය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී එය ප්‍රධාන වශයෙන් පර්යාලෝක තුනක් ඔස්සේ විමසා බැලිය හැකි ය.

## 1. රූපවාහිනිය ඇරඹීම සඳහා වූ ඉල්ලීම්

නව විද්‍යුත් මාධ්‍යයන් ලොවපුරා ආරම්භ වනුයේ එම තාක්ෂණික ක්‍රියාවලිය නිපදවීමට පුරෝගාමී වූ වාණිජ සමාගම්වල මැදිහත් වීමෙනි. ගුවන්විදුලි මාධ්‍යය ආරම්භ වනවිට මාර්කෝනි සහ සමාගම දැක්වූ උනන්දුව ඊට ප්‍රබල සාක්ෂියකි. 20 වන සියවසේ තෙවන දශකය තුළ රූපවාහිනියේ අත්දැකීම යුරෝපීය ප්‍රජාවට ලබාගත හැකිවිය. ආකර්ශනීය මාධ්‍යයන් වූ බැවින් එහි ව්‍යාප්තිය ශීඝ්‍ර විය.

ලෝකයේ නව තාක්‍ෂණික වර්ධනයන් පිටුපස පවතිනුයේ බලය පිළිබඳ පවත්නා ගැටුම යි. එහි අනිවාර්ය ප්‍රතිපලය වන යුද්ධ එකී තාක්‍ෂණික වර්ධනයන්ට සපයනුයේ ප්‍රබල පිටිවහලකි. පළමු ලෝක යුද්ධය ගුවන්විදුලි මාධ්‍යයේ වර්ධනයට හේතු වූවා සේම, රූපවාහිනී මාධ්‍යයේ වර්ධනයට බලපෑවේ දෙවැනි ලෝක යුද්ධය යි. විශේෂයෙන් පශ්චාත් දෙවන ලෝක යුද සමයෙන් පසු ලෝකය ශීඝ්‍රයෙන් ද්විධ්‍රැවීකරණයට ( Bi Polarity ) හසුවීම හේතුවෙන් රූපවාහිනී මාධ්‍යය හුදු ජනමාධ්‍යයක හැඩයක් නොගනී. එය කිසියම් රටක ආර්ථික ක්‍රියාවලියේ ප්‍රධාන අවයවයකි. දේශපාලන බලයේ සංකේතයකි.

එක් එක් රටවල රූපවාහිනී මාධ්‍යයේ ආරම්භය පසුපස පවත්නා සාධක විමසා බැලීමෙන් මේ තත්ත්වය මැනවින් වටහා ගතහැකි ය. උදාහරණ ලෙස ඉරානයට රූපවාහිනි යන්ත්‍රය හඳුන්වා දෙනුයේ සුප්‍රසිද්ධ බීම වර්ගයක එරට නියෝජිතයාගේ මැදිහත්වීමෙනි. උගන්ඩාවට රූපවාහිනිය ලැබනුයේ එරට පාලකයකු ව සිටි ඉඩි අමීන් අප්‍රිකානු කොංග්‍රසය පවත්වා කලාපයේ දේශපාලන බලවතා ලෙස නැඟී සිටීමට ගත් උත්සහය හේතුවෙනි. ඉන්දියාවට පළමු රූපවාහිනී අත්දැකීම ලැබනුයේ පිලිප්ස් සමාගම නවදිල්ලියේදී පවත්වනු ලැබූ වෙළඳ ප්‍රදර්ශනයකිනි. එම මැදිහත්වීම මත ඉන්දියානු රජය එම සමාගම හා එක් ව රූපවාහිනි සේවාවක් ආරම්භ කරන ලදී.[1]

ශ්‍රී ලංකාවට රූපවාහිනිය හඳුන්වාදීමට ගත් උත්සහයන් අතර හමුවන පළමු අවස්ථාව වන්නේ 1959 දී RCA (Radio Corporation of America) සමාගම කරනු ලැබූ ඉල්ලීම යි.[2]එම ඉල්ලීම ගැන සඳහන් වෙනත් එහි ඉදිරි ක්‍රියාමාර්ග ගැන කිසිදු සාක්ෂියක් හමු නොවේ. එම සමාගම 1960 දශකය මුල්භාගයේ දී එවකට සිටි පැවති රජයෙන් එම ඉල්ලීම නැවත වරක් කර ඇත. නොමිලේ රූපවාහිනී සේවාවන් ඇරඹීමටත් කොළඹ අවට සීමිත ප්‍රදේශයක් එමඟින් ආවරණය කිරීමටත් යෝජනා වූ නමුත් පිළිබඳ වැඩිදුර තොරතුරු නොමැත.[3]

60 දශකයේ මුල්භාගයේ දී ම ජර්මන් ෆෙඩරල් ජනරජය රූපවාහිනී සේවාවන් ඇරඹීමට යෝජනා ඉදිරිපත් කළ බවට තොරතුරු පවතී.

1964-65 කාලවල දී, මාර්කෝනි, යත, ෆයි, යන විදේශීය සමාගම්වල නියෝජිතයා ලෙස එඩ්මන්ඩ් වික්‍රමසිංහ විසින් රූපවාහිනියන් ඇරඹීමේ යෝජනා දෙකක් ඉදිරිපත් කරන ලදී. කෙසේ වූව ද එම යෝජනා ප්‍රතික්ෂේප වී තිබේ.[4]

ජර්මනියේ "BOSCH" සමාගම ද මෙරට කලු-සුදු රූපවාහිනී සේවාවන් ඇරඹීමට යෝජනා කළමුත් මෙරට මාධ්‍ය ප්‍රතිපත්ති සම්පාදකයින්ගෙන් ඊට උනන්දුවක් පළ නොවූ බව එඩ්වින් ආරියදාස පවසයි.[5]

මෙරට රූපවාහිනි සේවාවන් ආරම්භ කිරීමට සිදුකළ ඉල්ලීම් අතරින් වඩාත් ම කතාබහට ලක් වූ අවස්ථාවක් ලෙස 1966 ජර්මන් ෆෙඩරල් ජනපදය කළ ඉල්ලීම හැඳින්විය හැකි ය. එම යෝජනාව වූයේ රජයට අයත් රූපවාහිනී සංකීර්ණයක් ඉදිකර කොළඹ අවට ප්‍රදේශයේ සීමිත විකාශනයන් සිදුකිරීමේ තාක්ෂණික ආධාර සැපයීමයි. මෙම ඉල්ලීම ඉවත දැමීමට බලපෑ ප්‍රධාන හේතු දෙකක් හඳුනාගත හැකි ය.

01. රූපවාහිනිය සම්බන්ධයෙන් ඩඩ්ලි සේනානායක අගමැතිවරයාගේ පෞද්ගලික අත්දැකීම්

02. එවකට ගුවන්විදුලියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ව සිටි නෙවිල් ජයවීරගේ කරුණු දැක්වීම්

1965 දී අමරිකා එක්සත් ජනපදයේ දී වෛද්‍ය ප්‍රතිකාර ලබා ආපසු එමින් සිටි ඩඩ්ලි සේනානායක අගමැතිවරයා, ලන්ඩනයේ දී බී.බී.සී. සංදේශයේ සම්මුඛ සාකච්ඡාවකට එක්විණි. එම වැඩසටහන මෙහෙයවූ එච්.එම් ගුණසේකර ලංකාවේ රූපවාහිනී මාධ්‍ය ඇරඹීමට කටයුතු කරනවා ද? යන්න විමසූ විට අගමැතිවරයා ලබාදුන් පිළිතුරෙන් ඒ පිළිබඳ ඔහුගේ වූ අකමැත්ත හඳුනාගත හැකිවිය.

"මම අමරිකාවේ රූපවාහිනී නාලිකාවල තිබූ වැඩසටහන් නරඹා තිබුණා. නමුත් ඒවායේ වැඩසටහන් ගැන මම ගොඩක් කළකිරීමට පත්වෙලයි ඉන්නේ "[6]

ජර්මන් රජයේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ යුතු බවට රජයට කරුණු ඉදිරිපත් කළ නෙවිල් ජයවීර ඊට හේතු ලෙස කරුණු කීපයක් දක්වා තිබුණි.[7]

1. ලංකාව පූර්ණ ලෙස ආවරණය කළ හැකි මධ්‍යම තරංග ගුවන්විදුලි විකාශන ක්‍රමයන් නොපැවතීම
2. කොළඹ සිට සැතපුම් 30 ක කලාපයක පමණක් රූපවාහිනිය විකාශයක් ඇරඹීමෙන් සමාජ පරතරය වැඩිවීම. ග්‍රාමීය ප්‍රදේශවලට ගුවන්විදුලියවත් නොලැබීමේ තත්ත්වයන් තුළ එකී ගුවන්විදුලි සේවා හොඳින් ශ්‍රවණය කළ හැකි කලාපයට තවත් සන්නිවේදන මාධ්‍යයක් ලබාදීම යෝග්‍ය නොවේ.
3. ප්‍රාග්ධනය හා පවත්වාගෙන යාමේ ගැටළු. රූපවාහිනිය සඳහා අතිවිශාල වියදමක් දැරීමට සිදුවීම. එකල පිළිගත් ගණන් බැලීමේ ක්‍රමය අනුව රූපවාහිනියේ එක් මිනිත්තුවක ගුවන් කාලයක් සඳහා ගුවන්විදුලියේ මිනිත්තු 28 ක ගුවන්කාලයකට යන වියදම දැරීමට සිදුවීම.

1967 දී රූපවාහිනී තාක්ෂණ පිළිබඳ විදේශ අධ්‍යයනය ලබා මෙරටට පැමිණි ශාන් වික්‍රමසිංහ විසින් අගමැතිවරයාගෙන් කරනු ලැබූ ඉල්ලීම ද ප්‍රතික්ෂේප විණි.[8] 1970 දී බලයට පත්වූ නව රජයට ද එම ඉල්ලීමට ඉදිරිපත් කළ නමුත් එයට යහපත් ප්‍රතිචාරයන් නො ලැබුණි.[9]

ඇතැම් විටක එම ඉල්ලීම යටපත් වීමට බලපෑ එක් හේතුවක් ලෙස සැලකිය හැක්කේ එවකට පැවති රජය සමඟ දැඩි සහයෝගිතාවකින් කටයුතු කරනු ලැබූ යුගෝස්ලාවියානු ආණ්ඩුව ද මෙරට රූපවාහිනී සේවාවන් ආරම්භ කිරීමට කටයුතු කරන බවට පැවති රාවය යි. ඒ පිළිබඳ නිල තොරතුරු නොපවත්නා නමුත් රටේ පැවති ආර්ථික තත්ත්වය සලකා එවැනි වියදම් අධික මාධ්‍යයට යොමුවිය නොහැකි බවට අදහස් ඉදිරිපත් වුණි.[10]

1977 දී ජේ ආර් ජයවර්ධන අගමැතිවරයා බලයට පත්වූ විට ශාන් වික්‍රමසිංහ විසින් තෙවන වරටත් තම යෝජනාව ඉදිරිපත් කරනු ලැබීය.[11]

එම ඉල්ලීම ඉදිරිපත් වන විටත් රජය, ජපන් රජය සමඟ එක්ව මෙරටට රූපවාහිනී සේවාවක් ලබාදීමට එකඟ වී සිට බව පෙන්වා දිය හැකි ය. ඒ බව සනාථ වන්නේ මෙරටට රූපවාහිනිය හඳුන්වාදීම සම්බන්ධයෙන් එවකට මෙරට ජපන් තනාපති ව සිටි ඕම් කෙයිසුකේ ඕච් කළ ප්‍රකාශයකිනි.

"ජපන් ආණ්ඩුව මෙම තීරණයට එළඹ ඇත්තේ දෙරට අතර පවත්නා මිත්‍රත්වය වැඩි දියුණු කිරීම පිණිසත් යුද්ධයෙන් පසුව ජපානය විසින් ගෞරවයෙන් හා කෘතඥතාවයෙන් සෑම විටම සිහිපත් කරනු ලබන ජේ.ආර්. ජයවර්ධන මහතා ජනාධිපති ධුරයට පත්වීම නිමිත්තෙන් හෘදයාංගම සුභාශිංසනය පිරිනමනු පිණිසත් ය."[12]

ඒ අනුව 1978 ජනවාරි මාසය වන විටත් මෙරට ඉදිකිරීමට යෝජිත රූපවාහිනී මධ්‍යස්ථායේ සැලසුම හා ආකෘති සම්පූර්ණ කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ජපන් තානාපතිවරයා, ජනාධිපති සහ එවකට ප්‍රවෘත්ති හා ගුවන්විදුලි ඇමතිවරයා ව සිටි ඩී.බී විජේතුංග මහතා හමුවී තිබුණි. 1978 මැයි 08 වන දින මෙරටට පැමිණි ජපන් විශේෂඥ කණ්ඩායමක් රූපවාහිනිය ඇරඹීමට අදාළ ශක්‍යතා අධ්‍යයන වාර්තාව ඇමතිවරයාට ඉදිරිපත් කරනු ලැබීය.[13]

මේ ආකාරයට දශක තුනක කාලයක් තුළ දේශීය හා විදේශීය ඉල්ලීම් ගණනාවක් මෙරට රූපවාහිනී මධ්‍යස්ථාන ආරම්භ කිරීමටත්, රූපවාහිනී විකාශ සඳහා අවසර ඉල්ලා සිටි අයුරු හඳුනාගත හැකි ය.

## 2. රූපවාහිනිය පිළිබඳ වූ අත්හදා බැලීම් හා අත්දැකීම්

මෙරට පූර්ව - රූපවාහිනී ඉතිහාසය තුළ රූපවාහිනිය පිළිබඳ ව අත්දැකීම් හා අත්හදාබැලීම් ද වැදගත් තැනක් ගනී.

1950 දශකයේ දී එවකට ලංකා ගුවන්විදුලියේ සේවය කළ ටියුඩර් පෙරේරා නම් කාර්මික ශිල්පියා, තමන් විසින් සකස් කරගත් තාක්ෂණික උපකරණ භාවිතය කරමින් කාන්තාවගේ රූපයක් ඈතින් පිහිටි තිරයකට සම්ප්‍රේෂණය කළ බව වාර්තා වේ.[14] ඒ පිළිබඳව මෙරට පුවත්පත් වාර්තාකරනු ලැබූයේ රූපවාහිනියේ පැමිණීම ආසන්න ලෙස වුවත් එය ඉටු නො වුණි.

1969 දී පළවූ ප්‍රවෘත්ති වාර්තාවක් පිළිබඳ අවධානය යොමුකරන එච්.ඒ.ජේ හුළුගල්ල මහතා පෙන්වා දෙනුයේ, දකුණු ඉන්දියාව ආශ්‍රිත ව එම වසරේ ඉදිකිරීමට යෝජිත රූපවාහිනී මධ්‍යස්ථාන මගින් යාපනේ වැසියන්ට ද රූපවාහිනී නැරඹීමේ හැකියාවක් පවතින බව යි.[15] ඒ වනවිට විදෙස් රටවලින් මෙරටට ගෙන්වා තිබූ රූපවාහිනී යන්ත්‍ර අතරින් උතුරු ප්‍රදේශයේ තිබූ රූපවාහිනී යන්ත්‍රවලින් එම දර්ශන නැරඹීමේ හැකියාවක් පවතින්නට ඇතැයි අනුමාන කළ හැකි ය. ඒ වන විටත් දකුණු ඉන්දීය ගුවන්විදුලි සේවා යාපනේ වැසියන් අතර ජනප්‍රිය ව පැවතුණි.

එහෙත් ආතර්.සී ක්ලාර්ක් පෙන්වා දෙනුයේ තමන් ලංකාවේ පළමු රූපවාහිනී යන්ත්‍රයේ හිමිකරුවා ලෙසට යි. ඊට පසුබිම සැකසෙන්නේ ඉන්දියානු SITE (Satellite Instructional Television Experiment) වැඩසටහන යටතේ චන්ද්‍රිකා තරංග ලබාගත හැකි උපකරණ පද්ධතියක් ක්ලාර්ක්ගේ කොළඹ නිවසේ සවිකිරීම යි. ඒ 1975 අගෝස්තු මාසයේ දී ය. ඒ ඔස්සේ ATS-6 නම් චන්ද්‍රිකාව මඟින් ලබාදුන් රූපවාහිනී වැඩසටහන් ඉතා පැහැදිලි ලෙස නැරඹීමට හැකිවිය.

"සැතපුම් හැත්තෑදහක ගමනක් ගෙවා අහසින් පැමිණෙන රූපමාලාවේ ආකර්ශනය දෙස මෝහනය වූවන් මෙන් පැය ගනනක් බලාසිටි ප්‍රේක්ෂකයින්ට භාෂාව ගැටළුවක් නොවීය.[16]

1976 ජූලි මස 31 වන දින වනතුරු මෙම රූපවාහිනී වැඩසටහන් ලැබුණු අතර විවිධ තරාතිරමේ දේශපාලකයින්, නිලධාරීන් මෙන්ම ඈත ග්‍රාමීය පළාත්වල සිට පැමිණි පිරිස ද අඩුවක් නොවූ බව ක්ලාර්ක් පෙන්වා දෙයි.

1976 අගෝස්තු මස මෙරට පවත්වනු ලැබූ නොබැඳි ජාතීන්ගේ සමුළු අවස්ථාවේ දී රූපවාහිනී සේවාවක් පවත්වනු ලැබීය. සමුළුව වාර්තා කිරීමට පැමිණ සිටි යුගෝස්ලාවියානු රූපවාහිනී නියෝජිත පිරිසක් සංවෘත - රූපවාහිනී සේවාවන් (Closed Circit) මෙහෙය විය. කොළඹ පදනම් ආයතනයේ සිටි විදේශ ජනමාධ්‍යවේදීහු සමුළුවේ විශේෂ අවස්ථා එම විකාශය ඔස්සේ නැරඹීය.[17] ලේක්හවුස් ආයතනයේ ද එම වැඩසටහන් නැරඹූහ හැකි රූපවාහිනියක් සවිකර තිබූ බව එඩ්වින් ආරියදාස පවසයි.[18]

මීට සමාන්තර ව ශාන් වික්‍රමසිංහ හා අනිල් විජේවර්ධන නොබැඳි සමුළුව පැවති දිනවල කොළඹ අවට සැතපුම් 10 ක් පමණ දුරට අත්හදා බැලීමේ විකාශනයක් පවත්වාගෙන යාමට සමත් වූහ.[19] මෙරට තිබූ රූපවාහිනී යන්ත්‍ර 50 කට පමණ එකී දර්ශන ලබාගත හැකි වූ බව ද වාර්තා වේ.

1979 අප්‍රේල් 14 වන දින ස්වාධීන රූපවාහිනී සේවයේ විකාශන කටයුතු ඇරඹීමත් සමඟ ම රූපවාහිනිය සීමිත ප්‍රේක්ෂක පිරිසට නැරඹීමට හැකිවිය.

1979 ජූනි 05 වන දින නිකුත් කරනු ලැබූ අංක 39/5. දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ස්වාධීන රූපවාහිනී සේවය (ITN) රජයට පවරාගනු ලැබිණි. රජයට පවරාගත් පසු දිනපතා පැය පහක පමණ වැඩසටහන් විසිරුවා හරිනු ලැබීය. කොළඹ සිට සැතපුම් 15 ක පමණ ප්‍රදේශයකට ITN විකාශය දැකගත හැකිවිය. විකාශයේ විවිධ දුර්වලතා පැවති අතර ඊට හේතු ලෙස ද දැක්වූයේ [20]

1. විකාශන ඇන්ටනාව පිහිටුවා තිබූ ස්ථානය නුසුදුසු වීම.
2. විදුලි බලය උච්චාවචනය වීම
3. විකාශන යන්ත්‍රයේ බලය අඩුවීම. (කි.වො.1)
4. ප්‍රමාණවත් තරමට මුදල් නොතිබීම.

මෙම සීමාකම් හමුවේ වුව ද ස්වාධීන රූපවාහිනී විකාශයන් නැරඹීමට ජනතාව විශාල උනන්දුවක් දැක්වූ බව ජාතික රූපවාහිනිය ඇරඹීමට පෙර මෙරටට ගෙන්වනු ලැබූ රූපවාහිනී යන්ත්‍ර සංඛ්‍යාවෙන් වටහා ගතහැකි ය.

| වසර | 1978 | 1979 | 1980 | 1981 |
|---|---|---|---|---|
| වර්ණ | 510 | 15,434 | 11,752 | 35,756 |
| කළු සුදු | 1692 | 16,913 | 14,954 | 23,332 |
| එකතුව | 2202 | 32,347 | 26,706 | 59,088 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

1982 දී ජාතික රූපවාහිනියේ විකාශ කටයුතු ආරම්භ වීමට ප්‍රථම, 1980 ඔක්තෝබර් 07 සිට පරීක්ෂණ විකාශන කටයුතු ක්‍රියාත්මක කෙරිණි. ඒ යටතේ 1981 ඔක්තොම්බර් 22 වන දින එළිසෙබත් රැජිනගේ මෙරට සංචාරය සජීවී ව විකාශය කිරීමට හැකිවිය. ඉන්පසුව චාල්ස් ඩයනා විවාහ මංගල්‍යය ද සජීවි විකාශයක් ලෙස ඉදිරිපත් කෙරිණි.[21] මේ සම්බන්ධ ව අදහස් දක්වන විමල් පෙරේරා දක්වනුයේ "මේ වන විට ලංකාවේ තිබුණු රූපවාහිනී යන්ත්‍ර සියල්ල විකිණිලා තිබුණා. අපි පූර්ව ප්‍රචාරයක් ලබාදී තිබුණා. ඒ නිසා වෙන්න ඇති, එකක්වත් කොහේවත් ගන්න තිබුණේ නෑ. "[22]

ජාතික රූපවාහිනියේ නිල විකාශන කටයුතු ආරම්භ වූයේ 1982 පෙබරවාරි 15 වන දින ය.

## 3. ප්‍රතිපත්ති, සාකච්ඡා හා සංවාද

ශ්‍රී ලංකාවට රූපවාහිනී සේවාවන් හඳුන්වා දීමට ගත් ප්‍රතිපත්තිමය සාකච්ඡාවන් යටත් විජිත යුගය දක්වා දක්වා දිවයයි. ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි විකාශන කටයුතු සොයා බැලීමට 1941 දී පත්කරන ලද කන්දයියා වෛද්‍යනාදන් කොමිසම මුල්වරට මෙරට රූපවාහිනී විකාශයන් ඇරඹීමට ඇති හැකියාව විමසා බලනු ලැබීය.[23]

1953 දී ලංකාවේ ගුවන්විදුලි ප්‍රචාරක කටයුතු පරීක්ෂා කර බලා වාර්තා කිරීමට පත්කර තිබූ වීරසූරිය කොමිසමට පැවරුණු කරුණු 3 යටතේ, දෙවනි කාරණය ලෙස ලෙස දැක්වූයේ "රූපවාහිනිය ලංකාවට හඳුන්වාදීම සුදුසු ද යන්න සොයාබලා වාර්තා කිරීම යි. "[24] වීරසූරිය කොමිසමේ අදහස වූයේ රූපවාහිනියක් මෙරට ඇරඹීමේ ගැටළු වන්නේ ප්‍රාග්ධනය හෝ නඩත්තු වියදම් නොවන බවයි. වැඩසටහන්කරණය පිළිබඳ ව පවත්නා දැනුම හා රූපවාහිනී යන්ත්‍රවල මිලගණන් දරාගත හැකි ද යන ප්‍රශ්නය වාර්තාවෙන් මතුකර තිබුණි.

1965 දී පත්කරනු ලැබූ හුළුගල්ල කොමිසම මඟින් ද රූපවාහිනී සේවාවක් පිළිබඳ සාකච්ඡාව ඉදිරියට ගෙනෙන ලදී. එහි නිර්දේශ අතර වූයේ ඉදිරියේ දී දියුණු කර ගැනීමේ අරමුණින් සුළු වශයෙන්

හෝ රූපවාහිනී සේවාවක් ආරම්භ කළ යුතු බව යි.[25] හුළුගල්ල කොමිසමට ලිපියක් ඉදිරිපත් කළ ආතර් සී ක්ලාර්ක් පෙන්වා දෙනු ලැබූයේ "ඉදිරි වසර 10 ඇතුළත (සමහර විට වසර 5 කට පෙර) පාලනය කළ නොහැකි ලෙස රූපවාහිනී හා ගුවන්විදුලි තරංග පිටරටින් පැමිණිය හැකි බව යි. මෙරට ගුවන්විදුලිය පියවර නොගතහොත් නොතේරෙන භාෂාවලින් හා වෙනත් සංස්කෘතීන්ගේ රූපරාමු මෙරට නිවෙස්වලට ලැබෙනු ඇත" ලංකාවට රූපවාහිනිය හඳුන්වාදීම පමාකිරීම යෝග්‍ය නොවන, නමුත් ඊට පෙර මූල්‍යමය තත්ත්වයන්, විදේශ විනිමය පිළිබඳ ව ද විමසා බැලිය යුතු බවට කොමිසම ඉඟි කළේ ය. මේ කාලය වනවිට ඇෆ්ගනිස්ථානය, බුරුමය හා ලංකාව හැරුණු විට සෙසු සියලු ම රටවල් රූපවාහිනිය අරඹා තිබුණි.

1972 දී නිකුත් වූ වී සී ජයසූරිය ගුවන් විදුලි කොමිසන් සභා වාර්තාවේ රූපවාහිනී මාධ්‍යය පිළිබඳ දීර්ඝ ලෙස සාකච්ඡා කෙරුණි. රූපවාහිනිය සම්බන්ධ ව කොමිසමේ නිර්දේශ මෙසේ ය.[26]

1. මනාලෙස සැලසුම් කිරීමෙන් පසු දේශීය මුදල් යොදවා ප්‍රධාන වශයෙන් අධ්‍යාපනික හා තාක්ෂණික අවශ්‍යතාවලට යොමු වූ රූපවාහිනියක් ආරම්භ කිරීමට කටයුතු යෙදිය යුතු ය.
2. ආරම්භයක් වශයෙන් ලංකා ගුවන්විදුලිය යටතේ තාක්ෂණික සැලසුම්, මෙහෙයුම් හා සේවා ක්‍රියාත්මක කිරීම් සිදුකළ යුතු ය. පසුව එය වෙනම සංස්ථාවක් බවට පත්කළ හැකි ය.
3. රූපවාහිනිය පිළිබඳ අවසාන තීරණය ගැනීමට පෙර අධ්‍යාපන, සැලසුම් හා තොරතුරු අමාත්‍යාංශවලින් යුත් කමිටුවකින් ඊට අදාළ සියලු තත්ත්වයන් විමසා බැලිය යුතු ය.

මෙම නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙර සියලු තත්ත්වයන් විමසා බැලූ කොමිසම තොරතුරු අමාත්‍යාංශය යටතේ CBS (Radio) සහ CBS (Television) ලෙස වෙනම ඒකක දෙකක් වශයෙන් ගුවන්විදුලිය හා රූපවාහිනිය පවත්වාගෙන යා හැකි බවට කරුණු දැක්විය.[27]

1972 තිකුත් වූ ජයසූරිය කොමිසමේ සාමාජිකයන් වූ වී. සී. ජයසූරිය (සභාපති), විලින් ප්‍රනාන්දු සහ එම්.ඒ. ද සිල්වා යන අය අතරින් එම්.ඒ. ද සිල්වා විසින් වෙන ම වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. එහි ඉදිරිපත් කරනු ලැබූ රූපවාහිනිය පිළිබඳ නිර්දේශය මුල් වාර්තාවේ නිර්දේශවලට වඩා වෙනස් මුහුණුවරින් යුක්ත වේ.[28]

සමාජයේ ඇති හා නැති අතර පරතරය පිළිබඳ සිතා බැලීමේ දී ලංකාවට රූපවාහිනිය කෙසේවත් නොගැලපෙන බවට එම්.ඒ. ද සිල්වා කරුණු දැක්විය. ඔහුගේ ඍජු නිර්දේශය වූයේ "මෙරටට රූපවාහිනිය දරාගත නොහැකි මෙන්ම, අවශ්‍ය ද නොවන බවයි."[29]

මෙම නිර්දේශය ඉදිරිපත් කිරීමට පෙර එම කරුණු විවරණය කරමින් තම වාර්තාව ඉදිරිපත් කරන එම්.ඒ. ද සිල්වා දක්වනුයේ "රූපවාහිනියට පක්ෂ ව ඇති එකම මතය වන්නේ එය අධ්‍යාපනයට යොදා ගැනීමට ඇති හැකියාව යි. එහෙත් කොළඹ දරුවන්ට ගම්බද දරුවනට වඩා පහසුකම් පවතී. හොඳ චිත්‍රපට කිහිපයක් රටපුරා ප්‍රදර්ශනය කිරීමෙන් එම අධ්‍යාපනික අපේක්ෂාව ද ජය ගත හැකිය." "රූපවාහිනිය මුලින් ම හඳුන්වාදෙනු ලැබූයේ අධ්‍යාපනය ඉලක්ක කරගෙන ය. නමුත් ඉතා සුළු කාලයකින් එය අධ්‍යාපනයේ ප්‍රධාන හතුරා බවට පත්විය. කියවීම හා සිතීම්වලින් මනස වෙනතකට හරවයි. වැඩිහිටියන්ගේ අවධානය වෙනතකට යොමු කරයි. අපගේ අවශ්‍යතාව වන්නේ වැඩකිරීම සඳහා ඔවුන් යොමු කිරීම යි."

ඉන්දියාව රූපවාහිනිය ව්‍යාප්ත කිරිමේ දී එම නාලිකා මෙරට රූපවාහිනී යන්ත්‍ර සතු අයට නැරඹීමේ ඇති හැකියාව ද බැහැර නොකරන එම වාර්තාව පෙන්වා දෙනුයේ විශාල වශයෙන් පීඩා විඳින බහුතරයක් ජනතාවගේ වියදමින් සුළු පිරිසකට විනෝදාස්වාද සම්පාදනය යෝග්‍ය නොවන බව යි. ජාත්‍යන්තර රූපවාහිනී සේවා මෙරට වැසියන් නැරඹීමේ ගැටළුව මෙතෙක් පැන නැගී නොමැති බැවින් එය ඉදිරි කොමිසන් සභාවකින් විමසා බැලිය යුතු බව අවධාරණය කරයි.

මෙම විස්තරාත්මක වාර්තාව මෙරට රූපවාහිනියේ ප්‍රතිපත්ති පිළිබඳ ව සිදු කළ දියුණු මැදිහත් වීමක් සේ සැලකිය හැකි ය.

කෙසේ වුව ද ජයසූරිය කොමිසමේ නිර්දේශ පිළිගැනීමක් හෝ නොපිළිගැනීමක් පිළිබඳ තීන්දු ගැනීමකට රජය යොමු නොවීය.

අවසාන ප්‍රතිඵලය වූයේ 1977 නව රජය ජපානය සමඟ පැවැති පූර්ව එකඟතාව හමුවේ වුව ද නව රූපවාහිනී සේවාවක් ඇරඹීමට උනන්දුවක් දක්වන්නන්ගෙන් අයදුම්පත් කැඳවීමයි.

1978 ජූලි 05 දින ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ රූපවාහිනී සේවාවක් පවත්වාගෙන යාම සඳහා අයදුම්පත් කැඳවන ලදී. රූපවාහිනී සේවාවක් සඳහා වන උනන්දුව හේතුවෙන් අයදුම්පත් 40 ක් ඉදිරිපත් වූ අතර ඉන් දෙකක් තෝරා ගැනුණි. ඒ විදුලි උපකරණ සැපයීමේ සමාගමක් වූ මොරිස් රෝච් සහ සංගීතා (පසුව ස්වාධීන රූපවාහිනී ලෙස නම වෙනස් විය) යන සමාගම් ය. 1978 දෙසැම්බර් 29 වන දින රූපවාහිනී සේවාවන් ඇරඹීමේ බලපත්‍ර ගාස්තු ලෙස රුපියල් ලක්ෂයක මුදලක් ගෙවන ලෙස අදාළ සමාගම් දෙකට දැනුම් දුන් අතර ඊට ලබා දී තිබුණේ දින දෙකක කාලයකි. (1978 දෙසැම්බර් 31 දිනට පෙර)අදාළ මුදල තැන්පත් කිරීමට නොහැකි වුවහොත් බලපත්‍රය ලබා නොදෙන බවට දැක්වූ එම ලිපියට අත්සන් තබා තිබුණේ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යංශයේ ලේකම් ව සිටි ආචාර්ය සරත් අමුණුගම ය.[30]

ශාන් වික්‍රමසිංහ හා අනිල් විජේවර්ධන එකතුව රුපියල් ලක්ෂයක තැන්පතුව ඉදිරිපත් කළේ ය. 1979 ජනවාරි 1 වන සමාගම් දෙකම සාකච්ඡාවකට කැඳවූ නමුත් මොරිස් රෝච්සමාගම ඊට ඉදිරිපත් නොවුණි. නව සේවාව ආරම්භ කිරීමට මාස 06 ක කාලයක් ඉල්ලා සිටිය ද, බලපත්‍රයේ කොන්දේසිය වූයේ අප්‍රේල් 15 ට පෙර විකාශන කටයුතු ආරම්භ කළ යුතු බවයි.[31] එසේ නොකළහොත් බලපත්‍රය අවලංගු වේ. එම බලපත්‍රයේ සඳහන් අනෙකුත් කොන්දේසි කවරේ ද යන්න පිළිබඳ පැහැදිලි ප්‍රකාශයක් නොමැති නමුත් පැය 24 කට වඩා වැඩි කාලයක් විකාශන කටයුතු සිදු නොකලහොත් බලපත්‍රය පවරා ගන්නා බවට වගන්තියක් ඇතුළත් වූ බව පසුව හෙළි වුණි.[32] කෙසේ වුව ද බලපත්‍රය මාස 06 අත්හදා බැලීම් අවදියකට යටත් කර තිබූ අතර ඉන්පසුව විකාශන අවසරය දීර්ඝ කළ යුතු විය.[33]

ස්වාධීන රූපවාහිනී සේවය ඇරඹීමේ කටයුතු එසේ සිදුවෙමින් පවතිද්දී ජාතික රූපවාහිනිය ඇරඹීමේ කටයුතු ද ඊට සමාන්තර ව සිදු වූ බව හඳුනාගත හැකි ය. නව අමාත්‍යාංශ වර්ගීකරණය යටතේ රූපවාහිනී විෂය රාජ්‍ය අමාත්‍යාංශයට එක්විය. ඒ අනුව එම

අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය සරත් අමුණුගමගේ ප්‍රධානත්වයෙන් ජාතික රූපවාහිනී සැලසුම් කමිටුව පිහිටුවන ලදී. (NTPC)

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ හා රාජ්‍ය චිත්‍රපට අංශයේ (GFU) නිලධාරීන් හා සේවකයින් ගණනාවකින් එම කමිටුව සමන්විත විය.

1979 පෙබරවාරි 26 වන දින රැස්වූ එම කමිටුවේ තුන්වන රැස්වීමේ දී සාකච්ඡා වී ඇත්තේ 1980 අගභාගය වන විට රූපවාහිනිය ඇරඹීමේ කටයුතු සූදානම් කළයුතු බව යි. එදින රැස්වීම් වාර්තාවේ 3.1 අංකය යටතේ දක්වා ඇත්තේ ස්වාධීන රූපවාහිනිය 1979 සිංහල අලුත් අවුරුද්දට පෙර විකාශන කටයුතු ආරම්භ කරන බවට ඇඟවීම කර ඇති බව යි.[34] (NTPC) කාර්යාලය රජයේ චිත්‍රපට අංශයේ දී 1979 මාර්තු 9 වන දින විවෘත කරන ලදී.

මෙරටට රූපවාහිනී සේවාවන් ඇරඹීමේ කටයුතු සිදුවෙමින් පවතිද්දී නව මාධ්‍ය සම්බන්ධයෙන් ශාස්ත්‍රීය සංවාද හා සාකච්ඡා මණ්ඩප විවිධ ස්ථානවල සංවිධානය කෙරුණි. 1978 අගෝස්තු 21-25 යන දිනවල "සිනමාවෙන් රූපවාහිනියට පිවිසීම" මැයෙන් ජාතික කතෝලික සිනමා පර්ෂදය බොරැල්ල ඇක්වයිනාස්හි දී සම්මන්ත්‍රණයක් කැඳවන ලදී. එවකට විෂයභාර ඇමතිවරයා විසින් සම්මන්ත්‍රණය ආරම්භ කළ අතර එහි ප්‍රධාන ගැටළු ලෙස සාකච්ඡා වූයේ.[35]

1. රූපවාහිනිය ලංකාවට අවශ්‍යය ද ? ගැලපේ ද?
2. රූපවාහිනිය ගැන දන්න අය ලංකාවේ සිටිත් ද?
3. රූපවාහිනිය ලංකාවට ඔරොත්තු දෙයි ද? යන්න යි.

ආචාර්ය සරත් අමුණුගම, ආරියරත්න ලංකාචන්ද, ටයිටස් තොටවත්ත, සිසිල් ප්‍රනාන්දු, ගාමිණී දිසානායක, එච්.ඒ සෙනෙවිරත්න, අනුර ගුණසේකර, මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු, මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර යන අය සම්පත්දායකයින් ලෙස ඊට එක්වූහ.

මේ අවධිය වනවිට මෙරට ආකර්ශනීය මාධ්‍යය ලෙස වර්ධනය වී තිබුණේ සිනමාව යි. රූපවාහිනියේ ආගමනය සිනමා කර්මාන්තයට අභියෝගයක් විය හැකි බවට මත පළවී තිබුණි. රූපවාහිනිය සිනමාවට බලපෑ ආකාරය ඇමරිකානු සංඛ්‍යාලේඛන සහිත ව පෙන්වා දෙනු ලැබූයේ මහාචාර්ය විමල් දිසානායක විසිනි.[36]

| වර්ෂය | (රූපවාහිනී සංඛ්‍යාව) (දහස්ගණනින්) | රූපවාහිනි මධ්‍යස්ථාන | සතියකට චිත්‍රපට නරඹන සංඛ්‍යාව (මිලියන) |
|---|---|---|---|
| 1946 | 8 | 6 | 90 |
| 1956 | 34,900 | 442 | 47 |

වසර දහයක් තුළ දී රූපවාහිනියේ වර්ධනයට සාපේක්ෂ ව චිත්‍රපට නරඹන සංඛ්‍යාව ශීඝ්‍ර ලෙස අඩුවී තිබේ. එහෙත් සිනමා මාධ්‍යය යනු රූපවාහිනී මාධ්‍යයට සමානකම් මෙන් ම අසමානකම්ද පවත්නා මාධ්‍යයකි. ඊට ආවේණික අනන්‍යතා තුළ සිනමා මාධ්‍යයට ගොඩනැගිය හැකි ය.

කෙසේ වුවත් රූපවාහිනී මාධ්‍යයේ පැමිණීම අනිවාර්ය වූ විට එහි හිතකර බව හා අහිතකර බව පිළිබඳ බොහෝ සංවාද මතුවිය. එවකට ලේක්හවුස්හි කතුවරයකු සිටි එඩ්වින් ආරියදාස, රූපවාහිනී මාධ්‍යයේ ප්‍රබලතා පිළිබඳ ව මෙන්ම එහි පවත්නා තාක්ෂණය ගැන ලිපි ලියා තිබුණි.[37] මේ නිසා නව මාධ්‍ය කෙරෙහි තරුණයින් තුළ කිසියම් උනන්දුවක් ඇති වී තිබූ බව හඳුනාගත හැකි ය.

එඩ්වින් ආරියදාස පෙන්වා දෙන්නේ රූපවාහිනියේ ආගමනයට ප්‍රතිපක්ෂ ව ප්‍රධාන මත 5 ක් සමාජයේ පැවැති බව යි.[38]

01. සංස්කෘතියට හානිකර වීම

02. පොහොසතුන්ට පමණක් සීමා වූ මාධ්‍යයන් බව

03. කුඩා දරුවනට විය හැකි බලපෑම

04. සමාජ සම්බන්ධතා බිඳවැටීම

05. රජය, දේශපාලනික ප්‍රචාරණයට යොදා ගැනීම.

වසර 2500 කටත් වඩා පවතින බවට පැවසෙන සංස්කෘතියක් එක් තාක්ෂණික මෙවලමක් නිසා බිඳ වැටෙන්නේ නම් එම සංස්කෘතිය පිළිබඳ අගයන් පවතින්නේද යන්න විමසා බැලිය යුතු බව ඊට ප්‍රතිපක්ෂ වූවන්ගේ අදහස විය.

කෙසේ වුව ද 1979.04.14 දින ඇරඹි ITN විකාශන කටයුතු 1979.06.05 දින රජයට පවරා ගනු ලැබිණි. මීට හේතු ලෙස විවිධ මත ඉදිරිපත් ව තිබේ. කෙසේ වුව ද පසුබිම් කරුණ වන්නේ බලපත්‍රයේ සඳහන් ආකාරයට පැය 24 කට වඩා වැඩි කාලයක් විකාශන කටයුතු නතර ව පැවතීම යි. ඊට හේතු ලෙස දක්වනුයේ,

1. අභ්‍යන්තර පරිපාලනමය ගැටළුවක් හේතුවෙන් විකාශන කටයුතු බිඳවැටුණු බව යි.
2. දවස පුරා ප්‍රදේශයේ විදුලිය ඇණහිටීම හා උච්චාවචනය වීම හේතුවෙන් උපකරණ පිලිස්සී යාම, යන කාරණයි.

ශාන් වික්‍රමසිංහ ඉදිරිපත් කරනුයේ දෙවැනි මතය යි. ඔහුට අනුව මහරගම ප්‍රදේශය පුරා පැවති විදුලි ඇණහිටීම හේතුවෙන් විකාශන කටයුතු ආරම්භ කළ නොහැකි විය.

මීට වෙනස් මතයක් ලෙස ඉදිරිපත් වනුයේ එකල ජනාධිපති ජේ.ආර් ජයවර්ධන තම අමාත්‍ය මණ්ඩලය සමඟ ITN හරහා රූපවාහිනී වැඩසටහන් නැරඹීමට සූදානම් ව සිටි බව යි. ඔහුගේ වසර දෙකක පාලන කාලය සම්බන්ධයෙන් නිපදවනු ලැබූ එම වැඩසටහන විකාශය නොකිරීම හේතුවෙන් රජයට පවරා ගැනීමේ නියෝගය නිකුත් කළ බව එහි හරය යි.

කෙසේ වුව ද මෙම ප්‍රබල වැදගත් තීන්දුව පිටුපස වූ හේතුව නිසි ලෙස හෙළිදරව් කර ගැනීම අපහසු වේ. ලංකාවේ රූපවාහිනී මාධ්‍ය ආරම්භ කිරීමේ ක්‍රියාවලිය දේශපාලන වශයෙන් වැදගත් ක්‍රියාවලියක් වුව ද එම සිද්ධිය ජේ. ආර් ජයවර්ධනගේ නිල චරිතාපදානය තුළ සටහන් නොවීම ද ගැටළුවකි.

ස්වාධීන රූපවාහිනිය පවරා ගැනීමත් සමඟ ම ගුවන්විදුලියේ ප්‍රධානියා ව සිටි තේවිස් ගුරුගේ එහි නිසි බලධාරියා ලෙස පත්කරනු ලැබිණි.

පූර්ව රූපවාහිනී යුගයේ ප්‍රතිපත්තිමය කාරණයට අදාළ ප්‍රධාන ම අවස්ථාව වනුයේ 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත පාර්ලිමේන්තුව මඟින් සම්මත කිරීම යි.

පනතේ අන්තර්ගතය සලකා බලනවිට පෙනී යන්නේ එය අධ්‍යාපනික මාධ්‍යයක් සේ සලකා කටයුතු කිරීමට උනන්දුවකින් පසුවන බව යි. එය 3.(1) ඈ වගන්තිය යටතේ දක්වා ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සමාජිකයකු අධ්‍යාපනය විෂයභාර ඇමතිවරයාගේ නියෝජිතයකු වියයුතු බව යි.

නව මාධ්‍යයේ අධ්‍යාපනික වැදගත්කම පිළිබඳ ජපන් තානාපතිවරයා ද පවසා තිබුණි. "නව සන්නිවේදන මාධ්‍යයක් වන මෙය අධ්‍යාපනය දියුණු කිරීමටත් කෘෂිකර්මය, ධීවර කටයුතු හා සුළු කර්මාන්ත පිළිබඳ තාක්ෂණික දැනුම පතුරුවා හැරීමෙන් ආර්ථිකය දියුණු කිරීමටත් උපකාරී වේ,"[39]

ප්‍රවෘත්ති අපක්ෂපාති ව ඉදිරිපත් කිරීමත්, වෙළඳ දැන්වීම් විකාශය කිරීමේ දී මහජන යහපත පිළිබඳ විමසිලිමත් වීමත් පනතේ බලතල හා කාර්ය යටතේ දක්වා තිබේ.

මෙම මූලික පර්යාලෝකයන් තුනට අමතර ව මූල්‍යමය හා අධ්‍යාපනික වශයෙන් අංශ දෙකක් විමර්ශනයට භාජනය කළ හැකි ය.

ස්වාධීන රූපවාහිනිය ආරම්භ වනුයේ පෞද්ගලික සමාගමක් ලෙසිනි. එබැවින් එහි ප්‍රාග්ධනය අදාළ කොටස්කරුවන් විසින් දරා තිබේ. මාස කීපයක් ඇතුළත එය පවරා ගන්නා විට සමාගම සතුව පැවති මුළු වත්කම් වටිනාකම රුපියල් මිලියන 4.2 ක් ලෙස ඇස්තමේන්තු කර තිබේ.

1979 සිට රූපවාහිනී යන්ත්‍ර ලබාගැනීම වෙනුවෙන් බලපත්‍ර ගාස්තුවක් අයකර තිබේ. එම කාර්යෙහි යෙදී සිටියේ තැපැල් දෙපාර්තමේන්තුව අයි.ටී.එන් සමාගම රජයට පවරාගත් පසු බලපත්‍ර ගාස්තුවෙන් ලැබුණු මුදල් එම සමාගමට ලබා දී තිබේ. 1979 ජූනි 05 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලසීමාව තුළ එමඟින් ලැබුණු ආදායමට මිලියන 1.2 ඉක්මවීය. එය සමස්ත ආදායමෙන් 60% කි. 1980 වසර බලපත්‍ර ගාස්තුවෙන් ලැබූ ආදායම සමස්ත ආදායමෙන් 36% ක් විය. එම වසර තුළ මාධයේ ජනප්‍රියත්වය හේතුවෙන් ගුවන්කාලය විකිණීමෙන් වැඩි මුදලක් එනම් මිලියන 4 ක් ඉපයීමට හැකි විය.

1979.02.26 දින පැවති ජාතික රූපවාහිනී සැලසුම් කමිටුවේ (NTPC) වාර්තාවට අනුව බලපත්‍ර ගාස්තුවලින් කොටසක් තාවකාලික ව කමිටුවේ කටයුතු සඳහා ද යොදාගනීමට යෝජනා වී තිබේ.

ජාතික රූපවාහිනිය ආරම්භ කිරීමේ සැලසුම ක්‍රියාත්මක කිරීමේ දී 1979 වසරේ දී ජපන් රජය ඊට වෙන් කළ මුදල යෙන් බිලියන 5.1 ක ප්‍රමාණයකි.[෴] රූපවාහිනී සංස්ථා පනත යටතේ බලපත්‍ර ගාස්තු හා වෙනත් ක්‍රමවලින් මුදල් ඉපයීමට බලතල පවරා දී තිබුණි.

නව මාධ්‍ය පිළිබඳ ව වන අධ්‍යාපනික පසුබිම හා තාක්ෂණික දැනුම පිළිබඳ විමසා බැලිය යුතු ය. විෂයයන් වශයෙන් ජනසන්නිවේදනය මෙරට විශ්වවිද්‍යාලයීය පද්ධතියට ම එක්වනුයේ 1973 වසරේ දී ය. නමුත් එහි දී රූපවාහිනිය පිළිබඳ විශේෂිත හැදෑරීමක් සිදුකළ බවට විෂය නිර්දේශ පිරික්සීමේ දී හඳුනාගත නොහැකිය. එහෙත් ගුවන්විදුලි සංස්ථාව යටතේ විදේශීය පුහුණු සඳහා සහභාගී වූවන්ට රූපවාහිනී මාධ්‍යය පිළිබඳ කිසියම් අදහසක් ප්‍රායෝගික අත්දැකීම් තිබුණි.

ශාන් වික්‍රමසිංහ මෙරට රූපවාහිනිය ඇරඹීමේ ක්‍රියාවලියට එක්වනුයේ එම මාධ්‍යයේ තාක්ෂණික පසුබිම පිළිබඳ අවබෝධයකිනි. එහෙත් මාධ්‍යමය වගකීම් හා භාවිතාවන් පිළිබඳව පැවති හැදෑරීම් පිළිබඳ වැඩි අවධානයක් නොවුණ බව ස්වාධීන රූපවාහිනියේ ආරම්භක විකාශයන් ඇසුරින් වටහාගත හැකිය. එය රජයට පවරාගත් පසුව ඊට වැඩි වශයෙන් ම එක්වනුයේ ගුවන්විදුලි සංස්ථාව යටතේ සිටි තාක්ෂණික හා වැඩසටහන් නිෂ්පාදකවරුන් ය. එහි නිසි බලධරයා වශයෙන් පත් වූ තේවිස් ගුරුගේ ගුවන්විදුලි සංස්ථාවේ ද කටයුතු මෙහෙය වූ බවක් පෙනේ. එහි බලපෑමට නතු වූ බවත් ජාතික රූපවාහිනිය ආරම්භ කිරීමට හෝ වර්නර් ට්‍රොයර් (Warír Troyer) නම් කැනේඩියානු විශේෂඥයා විසින් පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී.[෴]

මෙම පුහුණු පාඨමාලාවට 25 දෙනෙකු තෝරාගනු ලැබුවේ 6000ක් අයදුම්කරුවන් අතුරිනි. අ.පො.ස උසස් පෙළ අවම සුදුසුකම ලෙස සැලකූ අතර ජනමාධ්‍යවේදයේ යෙදී සිටියවුනට

ප්‍රමුඛත්වය ලබාදෙන ලදී. මාස 09 ක පුහුණුවෙන් පසු ඩිප්ලෝමා සහතිකයෙන් ප්‍රදානය කළ අතර රූපවාහිනී සේවාවේ රැකියාවක් ලබාදීම අනිවාර්ය නොවී ය.

ජාතික රූපවාහිනී සැලසුම් කමිටුවේ මෙහෙය වීම යටතේ 20 දෙනෙකුගෙන් යුත් පිරිසකට පුහුණු පාඨමාලාවක් පවත්වන ලද්දේ ජපානයේ NHK රූපවාහිනී පුහුණු ආයතනයේ මහාචාර්ය අකිර කොගීමා විසිනි. රූපවාහිනී තිරරචනා හා නිෂ්පාදනය හඳුන්වාදීමේ වැඩසටහනක් ජර්මන් සංස්කෘතික ආයතනය මඟින් පවත්වන ලදී.

1982 දී ජාතික රූපවාහිනිය පිහිටු වීමේ දී පුහුණුව ලැබූ සන්නිවේදකයින්ට අමතර ව අධ්‍යාපනික වැඩසටහන්කරණය සඳහා එක් එක් විෂයයන් යටතේ උපාධි ලබා සිටි ගුරුවරුන් ද එක්කර ගනු ලැබිණි.

මාධ්‍යය පිළිබඳ මූලික පුහුණුවක් ඔවුනට පසුව ලබාදෙන ලදී.

එසේ වුවත් නිසි මාධ්‍යමය පුහුණුවක් නොමැති වීම පිළිබඳ බොහෝ නිෂ්පාදනයන්ට හා වැඩසටහන්වලට චෝදනා එල්ල විය. ගුවන්විදුලියේ අත්දැකීම් තිබූ බැවින් බොහෝ විට රූපයට වඩා ශබ්දයට ප්‍රමුඛතාව ලැබුනු බව පෙනී යයි.

## සාරාංශගත නිගමනය

මෙම සියලු කරුණුවලින් පෙනී යන්නේ මෙරටට රූපවාහිනී සේවාවන් ලබාදීම පිළිබඳ දීර්ඝ කාලයක් පක්ෂ ව හා විපක්ෂ ව කරුණු ඉදිරිපත් වෙමින් පැවති බව යි. රටේ ආර්ථිකය ඊට ප්‍රධාන බාධකය ලෙස දැක්වුව ද වෙනත් පරිබාහිර කරුණු බලපා ඇති බව පෙනේ. ඇතැම් විචාරකයින් බරපතළ ලෙස තර්ක කරනුයේ මෙම මෙවලම් සංස්කෘතික වාහකයන් ලෙස මෙරට පැමිණෙනුයේ 1977 දී නිදහස් ආර්ථික ප්‍රතිපත්තියේ එක් අංගයක් වශයෙනි.[42] කෙසේ වුව ද ජපන් රජය රූපවාහිනී සේවාවන්ට අවශ්‍ය මූලික පසුබිම සැසීමක් සමඟ මෙරට ජපානයේ නිෂ්පාදන රූපවාහිනී යන්ත්‍ර අලෙවිය ශීඝ්‍රයෙන් වැඩි වූ බව පෙන්වා දිය යුතු ය.

## ශ්‍රී ලංකාවට රූපවාහිනී යන්ත්‍ර සපයන රටවල්

| රට | වසර | | | |
|---|---|---|---|---|
| | 1978 | 1979 | 1980 | 1981 |
| ජපානය | 418 | 17,607 | 12,022 | 40,018 |
| දීකොරියාව | - | 3586 | 3745 | 4885 |
| ජර්මන් සමූහාණ්ඩුව | 2 | 1118 | 5631 | 50 |
| සිංගප්පූරුව | 815 | 6027 | 2149 | 4193 |
| චීනය-තායිවාන් | 1 | 3001 | 1736 | 1929 |
| හොංකොං | 603 | 27 | 2 | 157 |
| එක්සත් රාජධානිය | 345 | 823 | 386 | 3068 |
| සෙසු රටවල් | 18 | 158 | 1036 | 4792 |
| එකතුව | 2202 | 32,347 | 26,706 | 59,088 |

### මූලාශ්‍රයඃ- ශ්‍රී ලංකා රේගුව

ඒ අනුව එම වසර 4 තුළ මෙරටට ගෙන් වූ සමස්ත රූපවාහිනී යන්ත්‍ර අතුරින් ජපන් රූපවාහිනී යන්ත්‍රවල අනුග්‍රහය පිළිවෙළින් 19%, 54%, 45% හා 68% වේ.

රූපවාහිනී සංස්ථාව ආරම්භ කිරීමේ කටයුතු සඳහා ජපන් රජය ලබා දුන් මුළු ප්‍රදානය රුපියල් මිලියන 270 පමණ වේ. ඉන් මිලියන 30 ක් පමණ සවිකිරීම හා උපදේශක සේවා සඳහා වෙන්කර තිබුණි.[43] එම කටයුතු සියල්ල ඉටුකරන ලද්දේ ජපන් ජාතික සමාගම් හා විශේෂඥයින් විසිනි. උපකරණ සඳහා වූ වියදම රුපියල් මිලියන 123 ක් වූ අතර, සියලු ම උපකරණ පාහේ ජපානයේ නිෂ්පාදිත ඒවා විය. මේ අනුව ප්‍රදානයට අයත් සියලු කටයුතු ජපානය විසින් ඉටු කිරීම මගින් එම ප්‍රදානය නැවත ජපානය වෙතම ඇදී යන බවත් පෙනේ. ලෝකයේ විවිධ රටවල් හා සමාගම් රූපවාහිනී තාක්ෂණය ලබාදීමත් සේවා ආරම්භ කිරීමටත් යෝජනා ඉදිරිපත් කරනුයේ මෙකී තත්ත්වය හා වෙළඳපොළ තත්ත්වයන් විමසා බැලීමෙනි.

ජපානයට පෙර මෙරටට ඉදිරිපත් වූ සියලු යෝජනා පසුපස පැවැතියේ ද මෙම යථාර්ථය යි. රජයට පවරා ගැනීමත් කිසියම් නිශ්චිත වැඩ පිළිවෙළක් ඔස්සේ සිදු වූවක් ද යන්න පිළිබඳ සැක මතු වේ. විවෘත ආර්ථිකය යටතේ පෞද්ගලික අංශයට ඉඩකඩ ලබාදෙන බව පවසා පසුව එය රජය සතු කරගත් බවක් හැඟේ. තවත් අතකින් එය දේශපාලන උපකරණයක් ලෙස භාවිත කිරීමට රජයට වුවමනා වූවා විය හැකි ය.

---

1. Mass Communication in India, Kevel.JKumar, Jaico, 2003 P 203
2. ලංකා රූපවාහිනිය, 25 වසර (සංස්) එස් සංජීව, හෙලන් මුතුමිණි, ගොඩගේ 2004, පි.අ. 05
3. රූපවාහිනී මහගෙදර, (සංස්) හසන්ත ශ්‍රී ලාල් හෙට්ටි ආරච්චි, ස්වාධීන රූපවාහිනී සේවය, 2004, පි.අ. 12
4. රූපවාහිනී මහගෙදර, (සංස්) හසන්ත ශ්‍රී ලාල් හෙට්ටි ආරච්චි, ස්වාධීන රූපවාහිනී සේවය, 2004, පි.අ. 12
5. 2007.01.27 දින එඩ්වින් ආරියදාස මහතා සමඟ පැවැත් වූ සාකච්ඡාව
6. ලංකා රූපවාහිනිය, 25 වසර (සංස්) එස් සංජීව, හෙලන් මුතුමිණි, ගොඩගේ 2004, පි.අ. 1xvi.
7. ආර්ථික විමසුම, 1982 ජූලි, පි.අ. 12-13
8. ලංකා රූපවාහිනිය, 25 වසර (සංස්) එස් සංජීව, හෙලන් මුතුමිණි, ගොඩගේ 2004, පි.අ. 06
9. කල්පනා,1984 අප්‍රේල්, පි.අ. 05
10. කල්පනා,1984 අප්‍රේල්, පි.අ. 05
11. දෙසතිය,1978 පෙබරවාරි 04, පි.අ. 11
12. Anniversary Issue,SCRC,1987, P 5,5 th
13. සහස්‍ර ප්‍රදීපය, (සංස්) හසන්ත ශ්‍රී ලාල් හෙට්ටි ආරච්චි, ස්වාධීන රූපවාහිනී සේවය, 1999, පි.අ. 26
14. Selected Journalism,HAJ, Hulugalle, AHD, 2004, P429
15. The view from Sevendip, Antur C, Clarke, Pan Book, London, 1979, P 236
16. ලංකා රූපවාහිනිය, 25 වසර (සංස්) එස් සංජීව, හෙලන් මුතුමිණි, ගොඩගේ 2004, පි.අ. xxxvi

17. 2007.01.27 දින එඩ්වින් ආරියදාස මහතා සමඟ සාකච්ඡාව
18. කල්පනා,1986 අප්‍රේල්, පි.අ. 05
19. පරිපාලන වාර්තා 1979/80 රජයට පවරාගත් ස්වාධීන රූපවාහිනී සේවය
21. Anniversary Issue,SCRC,1987, P 5,5 th
22. රූපවාහිනී - වන කලාපය, 1994 ජූනි, පි.අ.
23. ගුවන් විදුලි වංශය, ඩී.එම්. කොළඹගේ, ගුණරත්න මුද්‍රණ ශිල්පියෝ, 1980, පි.අ. 95
24. ගුවන් විදුලි වංශය, ඩී.එම්. කොළඹගේ, ගුණරත්න මුද්‍රණ ශිල්පියෝ, 1980, පි.අ. 101
25. Report of the Commisionr Inqury on the Ceylon Broadcasting COporation, 1972, Dec., P 104
26. ibid, P 85
27. ibid, P 85
28. ibid, P 85
29. ibid, P 85
30. රූපවාහිනී මහගෙදර, (සංස්) හසන්ත ශ්‍රී ලාල් හෙට්ටි ආරච්චි, ස්වාධීන රූපවාහිනී සේවය, 2004, පි.අ. 14
31. ලංකා රූපවාහිනිය, 25 වසර (සංස්) එස් සංජීව, හෙලන් මුතුමිණි, ගොඩගේ 2004, පි.අ. 12
32. ලංකා රූපවාහිනිය, 25 වසර (සංස්) එස් සංජීව, හෙලන් මුතුමිණි, ගොඩගේ 2004, පි.අ. 05
33. රූපවාහිනී මහගෙදර, (සංස්) හසන්ත ශ්‍රී ලාල් හෙට්ටි ආරච්චි, ස්වාධීන රූපවාහිනී සේවය, 2004, පි.අ. 15
34. Televisio in Sri Lanka, Aruna Selledurai, 1997, P 11
35. ලංකා රූපවාහිනිය, 25 වසර (සංස්) එස් සංජීව, හෙලන් මුතුමිණි, ගොඩගේ 2004, පි.අ. vii
36. සිනමා උත්තමාචාර දේශන මාලා අංක 3, සිංහල සිනමාව, කලාව හා කර්මාන්තය, 1979 මාර්තු 30, පදනම් ආයතනය, (දේශන පිටපත)
37. 147/148 සෝමවීර සේනානායක, අපි තවමත් සංසාරේ, දයාවංශ ජයකොඩි, 2002, පි.අ.
38. 2007.01.27 දින පැවැති සම්මුඛ සාකච්ඡාව
39 දෙසතිය, 1978 පෙබරවාරි 04, පි.අ. 11
40. Japan's Grant, Aid Projects in Sri Lanka, JICA, P 27
41. The Proffession of Broadcasting with special reference to Television, Dr. Anura Guhnasekara, SLTTI, Anniversary Lecture, 1985, P 8
42. ජැක්සන් ඇන්තනී, බද්ද දෙස මැද්ද සිට බැලීම හෙවත් ලංකාවේ ටෙලිවිෂන් අර්බුදය හඳුනා ගැනීම, 2006, පි.අ. 7-8
43. ආර්ථික විමසුම, 1979 ඔක්තොම්බර්/ නොවැම්බර්, පි.අ. 06

## සබරගමුව ශාස්ත්‍රීය සංග්‍රහයේ ලිපි රචකයන් /පර්යේෂකයන් සඳහා වන පොදු උපදෙස් මාලාව

1 සබරගමුව ශාස්ත්‍රීය සංග්‍රහය පර්යේෂණ සංග්‍රහයක් වන අතර ඒ සඳහා ඕනෑ ම විෂයකින් සිංහල භාෂාවෙන් පමණක් ලිපි බාර ගැනේ.

2 ඉදිරිපත් කරනු ලබන ලිපි $A_4$ පිටු 20 ක උපරිමයකින් සමන්විත විය යුතු අතර වචන 200 කට නොවැඩි සාරාංශයකින් (Abstract) යුක්ත වීම, ප්‍රධාන පර්යේෂණ ගැටළු, යොදාගත් ක්‍රමවේදය සහ අවසාන වශයෙන් මූලික නිගමනය සඳහන් වීම අවශ්‍ය වේ.

3 ලිපි පරිගණක යතුරු ලියනය කළ යුතු ය. ඒ සඳහා Microsoft Word, FM Abhaya, 12 යන අක්ෂර ප්‍රමිතීන් භාවිත කළ යුතු වන අතර $A_4$ ප්‍රමාණයේ කොළයක පේළි අතර ද්විත්වාවකාශයක් (Double-space) තිබීම අවශ්‍ය වේ.

4 මාතෘකා හා අනුමාතෘකා කෙටි හා පැහැදිලි විය යුතු අතර තද කළු අකුරෙන් විය යුතු ය.

5 වඩාත් දික් වූ උපුටා ගැනීම් ඒකාවකාශ (Single-space) විය යුතු ය. එසේ ම එහි දී එම උපුටා ගැනීමට, උපුටා ගැනීමේ ලකුණ තිබීම අත්‍යවශ්‍ය වේ.

6 සිංහල නොවන පද කළු අකුරෙන් තිබිය යුතු ය.

7 ලේඛනයේ දී "ප්‍රතිශතය" හෝ අදාළ ලකුණ (%) යන්න යොදා ගත යුතු ය. එකේ සිට දහය දක්වා වන ඉලක්කම් සඳහා අකුරු භාවිත කළ යුතු වන අතර 11 සිට ඉහළට අංකයන් ය. එහෙත් අංක පිළිවෙළක දී නිරන්තරයෙන් අංක හෝ අකුරු භාවිත කිරීම අවධාරණය කෙරේ. උදා: 5 සිට 10.

8 වගු හෝ රූපසටහන්වල මාතෘකා තද කළු අකුරෙන් යොදා අදාළ වගුවට ඉහළින් දැක්විය යුතු ය. ඒ සඳහා වන මූලාශ්‍රය හෝ සටහන් ඊට යටිනි. වගු හෝ රූප සටහන් වෙන වෙන ම පිළිවෙළින් අංකනය කළ යුතු ය. තීරු මාතෘකා මගින් ඉදිරිපත් කළ දත්තයන් මනා ව දැක්විය යුතු ය.

9 මූලාශ්‍රය සටහන් ඉදිරිපත් කිරීම, හාවර්ඩ් ශෛලිය හෙවත් පෙළ තුළ ම උපුටා දැක්වෙන කර්තෘ වර්ෂ ක්‍රමය (Author-date text citation) හෝ චිකාගෝ ශෛලිය හෙවත් පාදක සටහන් / පිටු අග සටහන් (Foot notes / End notes) ක්‍රමය හෝ දෙකෙන් එකක් පමණක් භාවිත කළ යුතු ය.

10 Ms Word වැඩසටහනකින් ප්‍රතිනිර්මාණය කළ නොහැකි රූප වෙත ම $A_4$ කොළයක ඉදිරිපත් කළ යුතු වන අතර ඒවාහි මාතෘකා පිළිබඳ තොරතුරු සටහන් මූලාශ්‍රය හා ලේඛනයෙහි ඒවාට හිමි නියම ස්ථානය ද පිළිබඳ විස්තර ද ඒ සමග විය යුතු ය.

11 ලිපියෙහි පළමු පිටපත කඩදාසිවල පමණක් ඉදිරිපත් කළ යුතු ය. අවසන් පිටපත කඩදාසිවල හා 3 ½ පමණ සංයුක්ත තැටියක බහා ඉදිරිපත් කළ යුතු ය.

12 සියලු ම උපුටාගැනීම් සහ වෙනත් කතුවරුන්ගේ බුද්ධිමය දේපළ මනා ව තුහවුරු කරමින් සඳහන් කළ යුතු ය.

13 ලිපියෙහි එන සටහන් පහත එන පරිදි විය යුතු ය. (රාහුල, වල්පොල 1999: 250) එනම් පොතෙහි කර්තෘ, ප්‍රකාශිත වර්ෂය හා පිටු අංක ආදිය යි.

14 එක ම වසරක් තුළ පළ වූ කතුවරුන්ගේ කෘති දෙකක් වෙන්කර හඳුනාගැනීම සඳහා අකුරු යොදා ගත යුතු ය. (අනුරුද්ධ, 1990 අ 1991 ආ).

15 ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය හා රූප සටහන් අකාරාදි පිළිවෙළට අලුත් පිටුවක සඳහන් කළ යුතු ය.

- පහත එන ක්‍රමය යොදා ගන්න.

පොත්: සුමනසාරහිමි, තිඹිරිවැව, 1996, සිංහල භාෂාවේ ව්‍යාකරණය, මරදාන, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ශාස්ත්‍රීය සංග්‍රහ: ආරියරත්න මනෝජ්, '19 වෙනි සියවසේ ශ්‍රී ලංකා සමාජයේ ආගමික ප්‍රබෝධය හා සංස්කෘතික අනන්‍යතාව', වැලමිටියාවේ ශ්‍රී කුසලධම්ම ප්‍රශස්ති, 2003 (සංස්) නාවින්නේ සුගුණ ධම්ම හිමි ආදි අය,. මරදාන, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

16 ලිපි එවිය යුතු ලිපිනය:

සම්බන්ධීකරණ සංස්කාරක,
සබරගමුව ශාස්ත්‍රීය සංග්‍රහය, භාෂා අධ්‍යනාංශය,
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය,
දු ක: 045-2280017
ෆැක්ස් : 045-2280034
විද්‍යුත් තැපැල්: sunil@sab.ac.lk

එච්. එම්. එස්. ප්‍රියනාත්
එස්. කොඩිතුවක්කු
ශ්‍රී ලංකාවේ කුඩා කර්මාන්ත වර්ධනයෙහිලා
සූක්ෂම ණයවල බලපෑම

සන්ධ්‍යා කහඳගමගේ
සිංහලයාගේ බත් සංග්‍රහ චාරිත්‍ර

හිනිදූම සුනිල් සෙනෙවි
කෙටිකතාවක් පාදක කොටගෙන චිත්‍රපටයක්
නිර්මාණය කිරීමේ දී තිරරචකයාගේ භූමිකාව:
ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ "නිධානය"
චිත්‍රපටය ඇසුරින් කෙරෙන විමර්ශනයකි

ඩබ්.ඩී.එන්.එස්.මෙන්ඩිස්
සංචාරක හෝටල් කර්මාන්තයේ නියුතු
සේවකයින්ගේ රැකියා තෘප්තිය කෙරෙහි මූල්‍ය
හා මූල්‍ය නොවන ප්‍රතිලාභවල බලපෑම
(සීගිරිය ප්‍රදේශයේ සංචාරක හෝටල් ආශ්‍රයෙනි)

මහින්ද පතිරණ
ඩෙරීඩියානු විසංයෝජනය ලෙස උපන්
බෞද්ධ අනිත්‍ය සංකල්පය: නීට්ෂේගේ බෞද්ධ
සබඳතා ඇසුරින් කළ විමසීමකි

විජයානන්ද රූපසිංහ
ශ්‍රී ලංකාවේ රූපවාහිනි මාධ්‍යයේ ඉතිහාසය
(පූර්ව - රූපවාහිනි යුගය පිළිබඳ අධ්‍යයනයක්)





ISSN 1800 - 1459

**National Digitization Project**

***National Science Foundation***

Institute : Sabaragamuwa University of Sri Lanka

1. Place of Scanning : Sabaragamuwa University of Sri Lanka, Belihuloya
2. Date Scanned : 2017-10-02
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : S.A.C. Sadaruwan

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : LIBRARIAN

Name : T.N. NEIGHSOOREI

Signature : ..........

Date : 2017-10-02

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*